# ලලිතවිස්තරයෙන් නිරූපිත අතිමානුෂික බෝධිසත්ත්වචරිතය

මීපිටියේ සීලරතන හිමි

## මහායානය

කණිෂ්ක රාජසමයේ (ක්‍රි.ව. 120 - 162) සංඝශාසනය විවිධ නිකායවලට අයත් භික්ෂූන් දහස් ගණනින් ශෝභාමත් විය. ඒ ඒ නිකායිකයෝ තම අභිමතය පරිදි බුද්ධ වචනයට අර්ථ සම්පාදනය කළහ. තථාගත ධර්මය විනාශ නොවීම පිණිසත්, විවිධ අර්ථ සම්පාදන කිරීම් විසින් පැන නගින දුෂ්කරතාවන් සමර්ථනය පිණිසත් ධර්ම සංගායනාවක අවශ්‍යතාව රජුට දැණිනි. විවිධ රටවල් නියෝජනය කරන භික්ෂූන් වහන්සේලා 500 නමකගේ සහභාගිත්වයෙන් පාර්ශ්ව තෙරුන්ගේ ප්‍රධානත්වයෙන් පුරා සමසක් තුළ කාශ්මීරයේ කුණ්ඩලවන ආරාමයෙහි දී සතරවන ධර්ම සංගායනාව පැවැත්විය. වසුමිත්‍ර තෙරුන් සභාපති ධූරය දැරූ අතර උපසභාපති ධූරය අශ්වඝෝෂාපාදයෝ දැරූහ.

උපදේශ ශාස්ත්‍ර - සූත්‍රපිටකයේ අර්ථවර්ණනාව, විනය විභාෂා ශාස්ත්‍ර - විනයාර්ථ වර්ණනාව, අභිධර්ම විභාෂා - අභිධර්ම පිටකයේ විශ්වකෝෂය ඇතුළු ව සම්පාදිත විභාෂාවන් (අටුවා) නානා දේශවාසී භික්ෂූහු ප්‍රමාණත්වයෙන් පිළිගත්හ. එතැන් පටන් ඔවුහු වෛභාෂික නමින් ප්‍රකට වූහ. සර්වාස්තිවාදීන්ගේ භාෂාව සංස්කෘතය වූ බැවින් මෙම විභාෂාවන් පළමුව රචනා වූයේ සංස්කෘතයෙනි.

සිවුවන ධර්මසංගායනාව නිසා බුදුදහමේ නව යුගයක් උදාකරමින් මහායාන බුදුදහමේ පැන නැඟීම සිදුවිය. ථෙරවාදයෙන් බිඳී ගිය සර්වාස්තිවාදී නිකාය ඇතුළු ව සියලු නිකායිකයෝ මහායානය යටතේ එකරාශී වූහ. කණිෂ්කගේ රාජ්‍ය බලය නිසා මහායාන බුදුදහම සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව ක්‍රි.ව. 1 ශතවර්ෂයේ දී කාශ්‍යප මාතංග විසින් චීනයට බුදුදහම ගෙනයන ලදී. කල් යත් ම වෙනත් ආගමික බලපෑම නිසා ඒ ඒ රටවල බුහුමනට ලක් වූ දෙවිවරු බුදුදහමට ඇතුළු වූහ. ආදිබුද්ධ, ධ්‍යානිබුද්ධ (අමිතාභ), බෝධිසත්ත්ව (අවලෝකිතේශ්වර, මංජුශ්‍රී, මෛත්‍රෙය, සමන්තභද්‍ර) ආදී ආගමික සංකල්ප ගොඩ නැගෙන්නට විය. බුද්ධ- බෝධිසත්ත්ව- අර්හත් සංකල්ප පිළිබඳ නවීන අදහස් පැන නගින්නට විය. බුදුන් හා බෝධිසත්ත්වයන් පිළිබඳ විචිත්‍ර කථාන්තර ගොඩ නැගුහ. බුදුදහම විෂයයෙහි හින්දු දර්ශනයෙන් එල්ල

වූ අභියෝගවලට මුහුණ දීම පිණිස බුදුදහම දාර්ශනික පක්ෂයෙන් දියුණු කළහ.

- ථෙරවාදී අනාත්මවාදය වෙනුවට ශූන්‍යතාවාදය ගොඩ නැගූහ.
- බුදුන්ගේ අතිමානුෂිකත්වය නිරූපණය වන ධර්මග්‍රන්ථ සංස්කෘත භාෂාවෙන් රචනා කළහ.
- බුද්ධ බෝධිය උසස් බව ද, ප්‍රත්‍යෙක බෝධිය හා අර්හත් බෝධිය පහත් බව ද බුද්ධත්වය සඳහා බෝධි චිත්තය දියුණු කළ යුතු බව ද පැවැසූහ.
- ඒ සඳහා පාරමිතා (දාන, ශීල, ක්ෂාන්ති, වීර්ය, ධ්‍යාන, ප්‍රඥා) පූරණය කළ යුතු බව ද බෝධි චිත්තය වැඩීමෙන් සාක්ෂාත් කර ගන්නා බුද්ධත්වය අවස්ථා දශයකින් (ප්‍රමුදිතා, විමලා, ප්‍රභාකරී, අර්චිස්මතී, සුදුර්ජයා, අභිමුඛී, දූරංගමා, අචලා, සාධුමතී, ධර්මමේඝා යන දශභූමි) යුක්ත බව ද බුද්ධ ශරීරය ත්‍රිකායකින් (නිර්මාණකාය, සම්භෝගකාය, ධර්මකාය) යුක්ත බව ද දැක්වූහ.

ථෙරවාදී ප්‍රාථමික ඉගැන්වීම්වලට වඩා වෙනස් ඉගැන්වීම්වලින් සකස් වූ මහායානය කණිෂ්ක රාජ සමයේ අභිවෘද්ධියට පත් ව චීන - ජපන් - කොරියා - මොංගෝලියා - ටිබැට් - මධ්‍ය ආසියාව ආදී රටවල ව්‍යාප්ත විය.

## මහායාන ධර්මග්‍රන්ථ

මහායාන ධර්මය ප්‍රධාන කොටස් දෙකකින් සමුපේත ය. එනම්, සූත්‍ර ග්‍රන්ථ හා ශාස්ත්‍ර ග්‍රන්ථ වශයෙනි. බුදුරදුන්ගේ අතිමානුෂිකත්වය විදහා දක්වමින් බුද්ධ භක්තිය ඇති කරනු පිණිස රචිත ග්‍රන්ථ සූත්‍ර නම්. එම සූත්‍ර මුල් බුදුසමයට අයත් නිකාය ග්‍රන්ථවල ඇතුළත් නොවූනත් කර්මය, පුනර්භවය, ප්‍රතීත්‍යසමුත්පාදය, චතුරාර්ය සත්‍යය, මාර්ගඵල, සප්තතිංශ බෝධිපාක්ෂිකධර්ම වැනි මුල්බුදුසමයාගත මූලික සිද්ධාන්ත පදනම් කොට ගෙන රචනා වී ඇත. එකී ථේරවාදී මූලික සිද්ධාන්ත පිළිබඳ මහායාන ඉගැන්වීම් ඉදිරිපත් කිරීම මෙම සූත්‍ර සම්පාදනයෙන් අපේක්ෂා කෙරේ. මහායානයට අයත් මාධ්‍යමික හා යෝගාචාර සම්ප්‍රදායද්වයට අයත් ශූන්‍යතා දර්ශනයත්, විඥප්තිමාත්‍රතා දර්ශනයත් විවිධ නයින් විවරණය කිරීමත් මෙම සූත්‍රවල තවත් අපේක්ෂණයකි. බුදුන් වහන්සේ පිළිබඳ ලෝකෝත්තරවාදය, ත්‍රිකාය සිද්ධාන්තය,



පරාර්ථචර්යාව, බෝධිසත්ත්ව සංකල්පය පාදක කොට ගෙන ගොඩනැගී ඇති සැම මහායාන නිකායකින් ම අපේක්ෂා කරන පුද්ගල සංවර්ධනයට ඉවහල් වන පුළුල් ආගමික දර්ශනයක් හා ශික්ෂණ මාර්ගයක් පැහැදිලි කිරීමත් මෙම සූත්‍රවල තවත් අරමුණකි.

මහායාන සූත්‍රවල රචනා කාලය කණිෂ්ක රාජසමයේ සිදු වූ සිව්වන ධර්මසංගීතියෙන් පශ්චාද්භාගයට අයත් කෙරේ. ඒ අනුව කණිෂ්ක රජුට පසුවත් හියු - එං - සියැං ට පළමුවත් සම්පූර්ණ වන්නට ඇති බැවින් ක්‍රි.ව. 1-2 ශතවර්ෂ මහායාන සූත්‍රයන්ගේ රචනා සමය සේ සැලකේ. මහායාන සූත්‍ර විශාල සංඛ්‍යාවක් පැවැතිය ද මහායාන ධර්ම සාහිත්‍යය තුළ ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙන නවධර්ම නමින් හැඳින්වෙන ප්‍රධාන සූත්‍ර නවයකි. මේවා ධර්ම යන විශේෂණ නාමයකින් වෙසෙසා ඇත්තේ ආගමික ග්‍රන්ථ නොහොත් පූජනීය ග්‍රන්ථ යන අදහසින් විය හැකි ය. නවධර්ම, වෛපුල්‍ය සූත්‍ර යන අපර නාමයකින් ද හැඳින්වේ. විපුල යන්නෙහි තද්ධිත පදය වූ වෛපුල්‍යය යන්නෙන් අදහස් වන්නේ සවිස්තර ව සාකච්ඡා කරන පුළුල් මාතෘකා යන්න යි. එසේ ම විපුලත්ව සංඛ්‍යාත සම්බුද්'ධ බෝධිය පිණිස මග පෙන්වන නොහොත් ඒ පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් සූත්‍ර සමුදායක් නිසාවෙන් ද මේවා වෛපුල්‍ය සූත්‍ර නම්. මහායාන නවධර්ම ග්‍රන්ථ හෙවත් වෛපුල්‍යසූත්‍ර මෙසේ ය.

| | |
|---|---|
| 1. අෂ්ටසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා | 2. සද්ධර්මපුණ්ඩරීක |
| 3. ලලිතවිස්තර | 4. ලංකාවතාර- සද්ධර්මාලඞ්කාර |
| 5. සුවර්ණප්‍රභාස | 6. ගණ්ඩව්‍යූහ |
| 7. තථාගතගුහ්‍යක | 8. සමාධිරාජ |
| 9. දශභූමීශ්වර යනුවෙනි. | |

මහායානිකයෝ මෙම නවධර්ම, පිටක වශයෙන් සලකති. මහායාන ධර්මයට අයත් සුවිශේෂ අදහස් ඇතුළත් කෘති වීමේ ගෞරවය ද මේවාට හිමි වේ. මෙවැනි සූත්‍රවල නම්, ශ්‍රවණය කිරීම පවා සුගතියක් ලබා දීමට හේතු වන බව අමිතායුර්ධ්‍යාන සූත්‍රයේ සඳහන් වේ. මේවාට අමතර ව මහායානික ලැදියාව හා භක්තිය ප්‍රකාශ කෙරෙන තවත් සූත්‍ර රාශියක් ද වේ. ඒ අතර

- කරුණාපුණ්ඩරීක සූත්‍රය
- කාරණ්ඩව්‍යූහ සූත්‍රය

- o සුඛාවතීව්‍යූහ සූත්‍රය
- o රාෂ්ට්‍රපාල පරිපෘච්ඡා සූත්‍රය
- o ආර්යශාලිස්තම්භ සූත්‍රය
- o වජ්‍රච්ඡේදිකාප්‍රඥාපාරමිතා සූත්‍රය
- o මහායාන ශ්‍රද්ධෝත්පාදය
- o අභිසමයාලංකාරය
- o සූත්‍රාලංකාරය
- o විඥප්තිමාත්‍රතාසිද්ධි
- o මහාවස්තු
- o දිව්‍යාවදාන
- o කාශ්‍යපපරිවර්ත
- o මංජුශ්‍රීමූලකල්ප
- o අමිතායුර්ධ්‍යාන
- o සන්ධිනිර්මොචනසූත්‍ර
- o මහාපරිනිබ්බාණසූත්‍ර ආදිය ද වේ.

මෙම සූත්‍ර එක ම කාලයකට හෝ එක ම සම්ප්‍රදායකට අයත් ඒවා නොවේ. මාධ්‍යමක ශූන්‍යතාවාදී ගුරුකුලයට හා යොගාචාර විඥානවාදී ගුරුකුලයට අයත් ශාස්ත්‍ර ගණයට අයත් කෘති රාශියක් ද දක්නට ලැබේ. ඒ අතර

- o මූලමාධ්‍යමිකකාරිකා හෙවත් මාධ්‍යමකශාස්ත්‍ර
- o මාධ්‍යාන්ත විභාගශාස්ත්‍ර
- o යොගාචාරභූමිශාස්ත්‍ර
- o සත්‍යසිද්ධිශාස්ත්‍ර

සූත්‍ර ගණයට හෝ ශාස්ත්‍ර ගණයට අයත් නොවන තනි වියුක්ත ධර්ම ග්‍රන්ථ සමූහයක් ද දක්නට ලැබේ.

- o ශාන්තිදේවපාදයන්ගේ බෝධිචර්යාවතාරය, ශික්ෂාසමුච්චය, අභිසමයාලංකාරය
- o අශ්වඝොෂපාදයන්ගේ වජ්‍රසූචිය, මහායාන ශ්‍රද්ධෝත්පාදය,
- o නාගාර්ජුනපාදයන්ගේ විග්‍රහව්‍යාවර්තිනිය ඒ අතර වේ.

යෝගාචාර විඥානවාදයත් මාධ්‍යාමක ශූන්‍යතාවාදයත් නියෝජනය වන සමස්ත සූත්‍ර ග්‍රන්ථ හා ශාස්ත්‍ර ග්‍රන්ථවල බෙහෙවින් අධ්‍යයනයට ලක් වූ මාතෘකා කිහිපයකි. බුද්ධචරිතය, බුද්ධශරීරය, බුද්ධබලය, බුද්ධභූමි, බුද්ධප්‍රභාව, බුද්ධදර්ශනය, තදුපාය කෞශල්‍යය, පරාර්ථචර්යාව, බෝධිසත්ත්වචර්යාව, බෝධිචිත්තය, බෝධිසත්ත්වභූමි, දශභූමි, මහායාන පාරමිතා, මහායාන ශික්ෂණ මාර්ග, ශූන්‍යතාව, විඥානවාදය, ත්‍රිකාය සිද්ධාන්තය, සමාධිය යනාදි වශයෙනි.



## ලලිතවිස්තරය

සොනාර්ට් ආදි විචාරකයන්ගේ මතවාදවලට අනුව අශ්වඝෝෂපාදයන් විසින් රචිත යැයි සැලකෙන කෘතියකි, ලලිතවිස්තරය. එය මහායානිකයන් අතර අතිශයින් පූජ්‍යත්වයෙන් සැලකෙන අතර සූත්‍රයේ ම එය හඳුන්වා ඇත්තේ වෛපුල්‍ය සූත්‍රයක් හෙවත් පුළුල් ලෙස කැරෙන සාකච්ඡාවක් වශයෙනි.

" ලලිතවිස්තරො නාම ධර්මපර්යායඃ සූත්‍රාන්තො මහාවෛපුල්‍යඃ "

මෙම සූත්‍රයේ දැක්වෙන ආකාරයට වේළුවනාරාමයට රැස්වූ දොළොස් දහසක් භික්ෂූන්ගේ හා දෙ තිස්දහසක් බෝසත්වරුන්ගේ ඉල්ලීම මත ලලිතවිස්තරය බුදුරදුන් විසින් දේශනා කරන ලදී. නොයෙක් අද්භූත සිදුවීම්වලින් ගහණ ව බුද්ධචරිතය වර්ණනා කරන ලලිතවිස්තරය සියලු ලෝ වැසියනට යහපත සැලසනු වස් බුද්ධදේශනාවක විලාශයෙන් රචනා කරන ලද්දකි.

"තද්භික්ෂවො මෙ ශෘණුතෙහ සර්වෙ වෛපුල්‍යසූත්‍රං හි මහානිදානම්. යද්භාෂිතං සර්වතථාගතෛඃ ප්‍රාග් ලොකස්‍ය සර්වස්‍ය හිතාර්ථමෙව."

ක්‍රීඩා සමයේ පටන් බෝධිසත්ත්ව චරිතය විස්තර වන බැවින් මේ කෘතිය ලලිතවිස්තර නම් විය. (ලලිත යනු ක්‍රීඩාවයි)

මෙම සූත්‍රයේ පරමාර්ථ වන්නේ

- o මහායානය නගාලීම
- o සියලු බෝධිසත්ත්වයන් වහන්සේලා සම්භාවනා කිරීම
- o සියලු බෝධිසත්ත්වයානිකයන්ගේ සිත් තුළ පදහන් වීර්ය ඉපදවීම
- o සම්බුද්ධ ක්‍රියාවලිය මැනවින් විදහාලීම යි.

" භගවානපෙ‍්‍යතර්හි සංප්‍රකාශයෙත් ... මහායානොද්භාවනාර්ථං ... සර්වබෝධිසත්ත්වානාං චොද්භාවනාර්ථං ... සර්වබෝධිසත්ත්වයානිකානාං ච පුද්ගලානාං වීර්යාරම්භසංජනනාර්ථං ... බුද්ධකාර්යස්‍ය ච පරිසංදර්ශනාර්ථං ...

බුදුසිරිත අතිමානුෂික ලක්‍ෂණවලින් සමන්විත දිව්‍යමය ලලිතයක හෙවත් ක්‍රීඩාවක ආකාරයෙන් දැක්වීම මෙහි රචනා පරමාර්ථය වී ඇති බව ප්‍රකට ය. "ඕං නමො දශදිගන්තාපර්යන්ත ලොකධාතු- ප්‍රතිෂ්ඨිත සර්වබුද්ධබෝධිසත්ත්වාර්යශ්‍රාවක ප්‍රත්‍යෙක බුද්ධෙභ්‍යෝ'තීතානාගතප්‍රත්‍යුත්පන්නෙභ්‍යඃ" යනුවෙන් ඉෂ්ටදේවතා නමස්කාරයෙන් කෘතිය ආරම්භ වේ.

ලලිතවිස්තරය, පරිවර්ත නමින් හැඳින්වෙන පරිච්ඡේද විසිහතකින් සමුපේත ය.

| | පරිවර්තය | අන්තර්ගත කරුණු |
|---|---|---|
| 1 | නිදාන | බුදුරදුන් ශ්‍රාවස්තියේ ජේතවනාරාමයේ වැඩ වසන කල්හි 12000ක් භික්‍ෂුසංඝයා හා 32000ක් බෝධිසත්ත්වයන් විසින් පරිවරන ලදුව ... මධ්‍යම රාත්‍රියේ ධ්‍යානයකට සමවැදී, තම නළල් තලය මැදින් මහා රශ්මි කදම්බයක් විහිදී දිව්‍යලෝකය කරා යොමු කිරීම, ඉහළ ම ගණයේ දෙවි-දේවතාවන් ඉන් උද්‍යෝගිමත් වී බුදුන් කරා එළඹ ලලිතවිස්තර සූත්‍රය දේශනා කරන ලෙස බුදුන්ගෙන් ආයාචනා කැරෙන අතර බුදුහු නිහඬ ව සිටීමෙන් කැමැත්ත පළ කැර සිටිති. මෙම සූත්‍රය මීට පෙර බුදුවරුන් 55 නමක විසින් ද දේශනා කරනු ලැබ ඇති බව බුදුහු දෙසති. ඒ අතර පද්මෝත්තර හා දීපංකර යන බුදුවරුන් ප්‍රමුඛ සූවිසි බුදුවරු ද, අවසානයේ ශාක්‍යමුනීන්ද්‍රයනට පූර්වයෙන් ලොව පහළ වූ බුදුවරු සදෙන එනම් විපශ්යින්, ශිඛින්, විශ්වභූ, ක්‍රකුච්ඡන්ද, කනක හා කාශ්‍යප ද ඇතුළත් වෙති. |
| 2 | සමුත්සාහ | පසුදින උදෑසන බුදුරදුන් රැස්වූ පිරිසට තම අතීත කථාව දේශනා කිරීම, එහි දී තුෂිත දෙව්ලොව වසන කල බෝධිසත්ත්වයන් වහන්සේ තුළ බුද්ධත්වය සම්බන්ධයෙන් ඇති වූ මෙහෙයවීම සම්බන්ධයෙන් තොරතුරු දෙශනා කළහ. |
| 3 | කුලපරිශුද්ධ | බෝසත්හු ලොව පිහිටි රවවල්, නගර ආදිය පිරික්සා බලා ශාක්‍ය වංශයත්, කපිලවස්තු පුරයත්, ඉතා ම ප්‍රශස්ත වංශය හා නගරය වශයෙන් තෝරා ගැනීම |
| 4 | ධර්මාලොකමුඛ | බෝධිසත්ත්වයන් ස්වකීය අතීතය ස්මරණය කරමින් තමන්ගේ අන්තිම භවය සඳහා සූදානම විස්තර කෙරේ. |
| 5 | ප්‍රචල | ලොව බිහි වීමට සූදානම් වූ ආකාරය |
| 6 | ගර්භාවක්‍රාන්ති | මහාමායා බිසවගේ මව්කුස තුළ පිළිසිද ගැනීම් |

| | | |
|---|---|---|
| | | වශයෙන් බෝසතුන් මනුෂ්‍ය ලෝකයට පැමිණීම |
| 7 | ජන්ම | බෝසතුන් මෙලොව ඉපදීමට කල් පැමිණෙත් ම ලොව පුදුම සහගත සිදුවීම් 32ක් සිදුවීම හා ලුම්බිනි සල්වනයේ දී ඉපදීම, බෝසතුන් බැහැදැකීම සඳහා අසිත තවුසා හා දෙවිවරුන්ගේ පැමිණීම |
| 8 | දෙවකුලොපනයන | බෝසතුන් දේවාලයට කැඳවාගෙන යාම, එහි වූ දේවප්‍රතිමා ඔහු ඉදිරියේ නැගී සිටීම |
| 9 | ආභරණ | බෝසත් කුමරු සඳහා ආභරණ සැකසීම |
| 0 | ලිපිශාලාසංදර්ශන | ශිල්පෝද්ග්‍රහණය සඳහා පාසලට කැඳවා ගෙන යාම හා හෝඩි සම්බන්ධයෙන් කුමරු දැක්වූ ප්‍රාතිහාර්ය |
| 1 | කෘෂිග්‍රාම | තම ඉඩකඩම් වතුපිටි දේපළ පරීක්ෂා කර බැලීම හා සිත සමාධිගත කර ගැනීම සඳහා භාවනාවෙහි යෙදීම |
| 2 | ශිල්පසංදර්ශන | සිද්ධාර්ථ කුමාරයා විවිධ ශිල්ප දැක්වීමෙන් තම අප්‍රමාණ වූ කායික ශක්තිය ප්‍රකට කිරීම හා ගෝපා කුමරිය හා විවාහ වීම |
| 3 | සංචොදනා | දේවිවරුන් ලෞකික ජීවිතය හා සැප-සම්පත් අත්හරින ලෙස ඔහුගෙන් ඉල්ලා සිටි ආකාරය විස්තර වේ. |



| | | |
|---|---|---|
| 4 | ස්වප්න | සතර පෙර නිමිති දැකීම |
| 5 | අභිනිෂ්ක්‍රමණ | ගිහිගෙය අත්හැර යාම |
| 6 | බිම්බිසාරොපසංක්‍රමණ | බෝසතුන් පරම සත්‍යය ගවේෂණයෙහි යෙදීම, බිම්බිසාර රජු ස්වකීය රාජ්‍යය ඔහුට පූජා කරන්නට ඉදිරිපත් වීම |
| 7 | දුෂ්කරචර්යා | බුදුවීමට අනුගමනය කරන අත්තක්ලමථය හෙවත් ශරීරයට දුක්දීම |
| 8 | නෛරංජනා | බෝසතුන් නේරංජනා නදී තීරයෙහි තපස් රැකීම ද, සුජාතාවගේ කිරිපිඩු දානය විස්තර |
| 9 | බොධිමණ්ඩගමන | බුද්ධත්වය සඳහා බෝමැඩ කරා එළඹීම |
| 0 | බොධිමණ්ඩව්‍යුහ | බෝමැඩ කරා එළඹීමෙන් පසු දෙවිදෙවතාවන් විසින් විසින් ආශ්චර්යමත් පෙළහර දක්වීම හා බෝමැඩ බුදුවීම සඳහා සුදුසු තත්ත්වයට පත්කිරීම |
| 1 | මාරදර්ශන | මාර දිව්‍ය පුත්‍රයා, ඔහුගේ දියණියන් තිදෙනා ගේ අභියෝගය |
| 2 | අභිසම්බොධන | මාර සෙනග පරාජයට පත් කොට බෝධිය ප්‍රත්‍යක්ෂ කර ගැනීම |
| 3 | සංස්තව | දෙවිවරු ඔහු පසසමින් ඔහු අවබෝධ කොට ගත් නව සත්‍යය ලෝකයාට දේශනා කරන මෙන් ඉල්ලා සිටීම |

| | | |
|---|---|---|
| 4 | ත්‍රපුෂහල්ලික | බුදුරදුන් තමන් අවබෝධ කොට ගත් ධර්මය ලෝකයා පිළිගනී දෝ යන සැකය පහළ කිරීමත්, ත්‍රපුස හා භල්ලුක යන කෙළෙඹියන් දෙදෙනා උන් බැහැදකීමත් විස්තර කෙරේ. |
| 5 | අධ්‍යෙෂණ | බුදුරදුන් නව සත්‍යය ලෝකයාට දේශනා කිරීමට තීරණය කිරීම |
| 6 | ධර්මචක්‍ර | ප්‍රථම ධර්මදේශනාව බරණැස ඉසිපතනයේ දී සා අවුරුද්දක් තමන් සමග තවුස් දම් රැකි පස්වග තවුසනට දේශනා කිරීම |
| 7 | නිගම | බුදුරදුන්ගේ දේශනාව සමාප්ත කිරීම, දිව්‍ය මනුෂ්‍ය පිරිසට මෙම සූත්‍ර දේශනාව භාවිතයට යොදා ගන්නා ලෙස අනුශාසනා කිරීම, |

ලලිතවිස්තරය මහායාන හා හීනයාන යන දෙක අතරට වැටෙන කෘතියක් බව පෙන්වන ලක්ෂණ ඇතුළත් ව ඇත. මහායාන ලක්ෂණ කිසිවක් ප්‍රකට නොකරන පැරණි මූලාශ්‍රයන්ගෙන් ලබාගත් පැරැණි තොරතුරු මෙන් ම මහායාන ලක්ෂණ ඇතුළත් කරුණු ද දක්නට ලැබේ. මෙහි එන ඇතැම් සිද්ධි පාලි කතාපුවතෙහි (මහාවග්ග පාලි, බුද්ධවංස) දක්නට නැත. ඇතැම් සිද්ධි අන් කිසි දු තැනක සොයා ගත නොහැකි අතර ඒවා ඇතැම් විට කතුවරයාගේ ම නිර්මාණ විය හැකි ය. මහාචාර්ය වින්ටර්නිට්ස් දක්වන පරිදි ලලිතවිස්තරය යනු මහායානිකයන්ගේ ජීවයෙන් අලංකාර කළ පැරණි හීනයාන කෘතියක සංස්කරණයකි. මෙය සර්වාස්තිවාදීන්ගේ කෘතියක් බව ඊ.ජේ. තෝමස් පවසයි.

එහි රචිත කාලය සම්බන්ධයෙන් ස්ථිර නිගමනයක් නොමැත. ක්‍රි.පූ. 1 - ක්‍රි.ව. 1 සියවස අතර හෝ ක්‍රි.ව. 2 වන සියවසේ



ලියවෙන්නට ඇතැයි පිළිගැනේ. ලලිතවිස්තරයේ භාෂාව පාලි හා මිශ්‍ර සංස්කෘතයකි. වාග්වේදීහු එය ගාථාභාෂා නමින් හඳුන්වති. එය ගද්‍ය හා පද්‍ය දෙකේ සම්මිශ්‍රණයකි. කථාව සාමාන්‍යයෙන් ගද්‍යයෙන් ඉදිරිපත් කෙරේ. අතරින් පතර පද්‍ය ද වේ. ඇතැම් විට ඉතා දීර්ඝ පද්‍ය පාඨ ද දක්නට ලැබේ. මාරාභියෝගය විස්තර කරන්නේ කදිම පද්‍ය පන්තියකිනි. විභක්ති හීන රූප, විවිධාකාර ප්‍රාකෘතච්ඡායා, මාත්‍රාවිපරිණාමය යන ලක්ෂණ පද්‍යවල දක්නට ලැබේ. පද්‍ය බන්ධනය සඳහා බොහෝ සංස්කෘත කාව්‍යයන්හි භාවිත අතිශය සුන්දර වෘත්ත භාවිත කොට ඇත. මෙහි උපයුක්ත ඇතැම් වෘත්ත සංස්කෘතයෙහි ද භාවිත නොවේ. බුද්ධධර්මය ඉගෙනීමට බෙහෙවින් උපකාර වන අංගසම්පූර්ණ කෘතියක් සේ සලකන ලලිතවිස්තරය ක්‍රි.ව. 3 සියවසේ දී පමණ චීන භාෂාවට ද ක්‍රි.ව. 9 වන සියවසේ දී තිබ්බත භාෂාවට ද පරිවර්තිත ය.

## ලලිතවිස්තරාගත අතිමානුෂික බෝධිසත්ත්වචරිතය

මහාචාර්ය නලිනාක්ෂ දත්ට අනුව බුදුහිමිගේ ජීවන චරිතය විවරණය කරන කෘති පහකි. එනම්,

1. මහාසාංඝිකයන්ගේ මහාවස්තුව
2. සර්වාස්තිවාදීන්ගේ ලලිතවිස්තරය
3. අශ්වඝෝෂපාදයන්ගේ බුද්ධචරිත මහාකාව්‍යය
4. පාලි සාහිත්‍යාගත ජාතකට්ඨ කථාව
5. ධර්මගුප්තිකයන්ගේ අභිනිෂ්ක්‍රමණ සූත්‍රය

ථෙරවාදී ත්‍රිපිටකාගත (මහාවග්ගපාලිය,බුද්ධවංස) බුද්ධාපදානයෙහි දැක්වෙන මානුෂික ගති ලක්ෂණ ඉක්මවා යමින් ඒ තුළ අතිමානුෂික තත්ත්වයන් හා බැදුණු පූර්ණ වශයෙන් දේවත්වයට ආරෝපණය කරණු ලැබූ බුදුසිරිතක් ලලිතවිස්තරයෙහි දක්නට ලැබේ. ඒ අනුව බුද්ධිගෝචර ශ්‍රාවක සම්ප්‍රදාය භක්තිගෝචර ප්‍රවණතාවක් කරා ගමන් කිරීමේ නැඹුරුව ලලිතවිස්තරය තුළින් අනාවරණය වේ.

ථෙරවාදී ත්‍රිපිටක ඉගැන්වීම්වලට අනුව බුදුරදුන් දිව්‍යමනුෂ්‍ය දෙපිරිසේ ම ශාස්තෘවරයා විය. බුදුරදුන්, පන්සාලිස් වසක් පුරා ධර්මදේශකයා ලෙසත්, සංඝසමාජයේ ප්‍රතිෂ්ඨාපකා ලෙසත් තම ශ්‍රාවකයන්ගේ නොමඳ ගෞරවාදරයට හා භක්තියට පාත්‍රවිය. දානය

සඳහා පිඬු සිඟා වැඩීම, ගිලන් වූ කල බෙහෙත් වැළඳීම, සිරුර පිළිදගුම් සඳහා කලට වේලාවට සැතපීම, පිබිදීම, ශ්‍රාවකයනට අනුශාසනා පැවැත්වීම ආදි මානුෂික ඇවැතුම් පැවැතුම් පැවැත්වූහ. බොහෝ කලක් සියසින් බුදුරදුන් දුටු ශ්‍රාවකයෝ උන් වහන්සේගේ ඒ මානුෂික චර්යාවන් සියල්ල මතක තබා ගත්හ. පරම්පරාවෙන් පරම්පරාවට මතක තබා ගත් බුදුරදුන් පිළිබඳ මානුෂික ගති ලක්‍ෂණ ගැන තොරතුරු ත්‍රිපිටකය තුළ සුරක්ෂිත ව දක්නට ලැබේ. බුදුරදුන් මිනිස් ලොවට ආ දෙවියනට අනුශාසනා කලා පමණක් නොව දෙව්ලොව වැඩම කොට එහි සිටි දෙවියනට ද ධර්මදේශනා කළහ. පාළි ත්‍රිපිටකයේ බුදුරදුන්ගේ මානුෂිකත්වය සලකා ඇත.

මධ්‍යදේශයේ ගම් නියම්ගම් රාජධානි සිසාරා වැඩම කරමින් ධර්මචාරිකාවේ හැසිරුණු බුදුරදුන් තැනක දී දෙව්දතුන් කළ හිරිහැරවලට ද මුහුණපාමින් තැනක දී සංඝයා අතර ඇති වූ කලකෝලාහල සංසිඳුවමින් තැනක දී අපවත් වූ තම ශ්‍රාවකයන්ගේ ධාතු නිදන් කොට ස්තූප කරමින් තැනක දී ලෝකයාගේ ප්‍රශංසාව ද තැනක දී නින්දා පරිභව අසා දරමින් කල් යැවූ බුදුරදුන් මනුෂ්‍යත්වය නොඉක්මවා මිනිසකු වශයෙන් ථෙරවාදී සම්ප්‍රදාය තුළ නිරූපණය කොට ඇත.

බුදුරදුන් සියසින් දුටු ශ්‍රාවකයන් අපවත් වූ පසු පෙළපොත්වල දක්නට ලැබෙන ඉගැන්වීම් අනුව බුදුරදුන් පිළිබඳ ව ප්‍රතිරූපයක් නිර්මාණය කර ගත් ශ්‍රාවක පිරිසක් බිහි විය. ඔවුහු තම ශාස්තෘවරයා පිළිබඳ ව භක්තියෙන් කල්පනා කොට බුද්ධචරිතය සාමාන්‍ය මිනිස් ස්වභාවයන් ඉක්මවා ගිය සුවිශේෂී ගති ලක්‍ෂණවලින් සමන්විත වූවක් සේ සිතන්නට ඇත. ශ්‍රාවකයන් අතර ඇති වූ භක්තිපූර්වංගම ආකල්පයත් සමකාලීන සමාජ අවශ්‍යතාවක් ඉටු කිරීමේ උවමනාවත් වරින්වර ප්‍රබල ව නැඟී සිටි වෙනත් හේතු නිසාත් උන් වහන්සේ දේවත්වයට ආරෝපණය කරන ලදී. මේ ප්‍රවණතාව වර්ධනය වී බුදුරදුන්ගේ මානවචරිතය මුළුමනින් ම මනුෂ්‍යත්වය ඉක්මවා ගිය එකක් බවට පත් කරන ලදී. අචින්ත්‍ය දෙවියකුගේ තත්ත්වයට පත් කරන ලදී. භාරතීය සමාජයේ හින්දු බැතිමතුන් තුළ පැවැති බ්‍රහ්මන් පිළිබඳ සදාකාලික වූ ආකල්පය දුටු මහායානික බෞද්ධයෝ බෞද්ධ සමාජය තුළ ද එවැනි සදාකාලික ශාස්තෘවරයකු විද්‍යමාන බව පැහැදිලි කරමින් බුදුරදුන් පිළිබඳ ලොකෝත්තර වාදයක් ගොඩනැගූහ. එයට සමගාමී ව සම්භෝගකාය, නිර්මාණකාය හා ධර්මකාය යන



ත්‍රිකාය සිද්ධාන්තය ද ඉදිරිපත් කළහ. එකී බුදුරදුන් පිළිබඳ ලොකෝත්තරවාදයේ හා ත්‍රිකාය සිද්ධාන්තයේ ප්‍රතිඵල ලෙස ලලිතවිස්තරය හැඳින්විය හැක.

ලලිතවිස්තරයේ දක්නට ලැබෙන්නේ බුදුරදුන්ගේ මෙම පරම දිව්‍යත්වය පිළිබඳ එකදේශයකි. ලලිතවිස්තරයට අනුව බුදුරදුන් මනුෂ්‍යයෙකැයි හඳුනාගත හැක්කේ හුදෙක් මව්පියන් , කුලය, ජාතිය හා ජන්මභූමිය ගැන සඳහන් කොට තිබීම නිසාවෙනි. ථෙරවාදී ත්‍රිපිටකයෙහි බුදුවරුන් හා බෝසත්වරුන් අතර වෙනසක් තිබේ. එහි බෝසත්වරු බුදුවරුනට වඩා උසස් නොවෙති. ලලිතවිස්තරයට අනුව බෝසත් අවස්ථාවේ දී ම බෝසත්වරු බුදුවරුන් විසින් පුදන ලදහ. බුදුවරුන්ගේ මූලය බෝධිසත්ත්වයන් වන නිසා ඉතා උසස් තත්ත්වයක් ඔවුනට පිරිනැමිනි. ලලිතවිස්තරය ආරම්භයේ පටන් ම බුදුරදුන්ගේ ජන්මයේ සිට තත්චරිතය හා බැඳුණු සිදුවීම් සමුදාය ම පූර්ණවශයෙන් දේවත්වයට ආරෝපිත ය.

- බෝසත්හු මව්කුස පිළිසිඳ ගැනීමට ප්‍රථම පස්මහ බැලුම් බැලීම
- මවගේ සුදුසුකම් 32ක් හා කුලයේ සුදුසුකම් 64ක් පිරික්සීම
- ශුද්ධාවාසික දෙවිවරු බ්‍රාහ්මණ වෙසින් මනුලොවට පැමිණ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණ හා සප්ත රත්නය ගැන ඉගැන්වීම
- දෙව්ලොවින් චුත වීමට පෙර මාතෘකා 108 ක් යටතේ දෙවියනට ධර්ම දේශනා කිරීම
- දහස් ගණන් දෙවිවරුන් ධර්මාවබෝධය ලැබීම
- දෙවිවරු මායා දේවියට දේවාරක්‍ෂාව සැලසීම
- දෙවිදේවතාවෝ බෝසතුන්ගේ ගුණ ගායනා කළහ.
- සතරවරම් දෙවිවරු හා ශක්‍ර, සුයාම, සංතුෂිත, සුනිර්මිත, පරනිර්මිත වසවර්ති ආදී දෙවිවරු මනුලොවට පැමිණ බෝසතුනට විමාන නිර්මාණය කිරීම
- බෝසතුන් මායා දේවියගේ කුසෙහි පිහිටි රත්නකුටාගාරයක පහළවීම
- දෙවිවරු දේවියට හා කුමරුට ආරක්‍ෂා සැපයීම
- බෝසතුන් තුටු කිරීමට දිව්‍යමය සංගීතය සැපයීම
- සියලු දෙවිවරු තම තමන්ගේ විමාන රැගෙන කිඹුල්වතට පැමිණීම
- බෝසත් මව්තොමෝ තම තමන්ගේ විමානවල සිටින අයුරින් දෙවිවරුනට දිස්වීම
- බෝසත්හු මව්කුස සිට ම දෙවිවරුනට ධර්මදේශනා කිරීම

- බෝසතුන් කුසතුළ හොවා ගත් මායා බිසවට ආශ්චර්යමත් බලයක් හිමිවීම
- ඇයට කුස හුන් බෝසතුන් දැකීමේ හැකියාව තිබූ අතර නොයෙක් රෝග සුවපත් කිරීමේ හැකියාව ලැබීම

ථෙරවාදී සම්ප්‍රදාය, ත්‍රිපිටකාගත තොරතුරු අනුව බෝසතුන් මව් කුසින් බිහිවන්නේ සාමාන්‍ය මනුෂ්‍යයෙකු මෙන් ගැබ් මල තවරාගෙන නොවේ. ජාතකට්ඨකථාව, ධර්මාසයෙන් බසින ධර්මකථිකයකු සේ ද හිණිපෙළකින් බසින පුරුෂයකු සේ ද මළ නොතැවරී, පිරිසිදු ව පැහැදිලි ව බෝසතුන් මව් කුසින් නික්මෙන බව දක්වයි. උක්ත ජාතකට්ඨකථාවේ දැක්වෙන විස්තරය අනුව බෝසතුන් මව් කුසින් නික්මෙන බව ලලිතවිස්තරයේ ඉදිරිපත් කෙරේ.

ළදරු අවදියේ පටන් බෝසතුන්ගේ ජීවිත කථාව අද්භූතජනක සිදුවීම්වලින් පුරවා ලියා තිබෙනු අයුරු ද පැහැදිලි වේ.

- කුඩා කල බෝසතුන් දේවාලයට ගෙන ගිය විට දේව ප්‍රතිමා සිටි තැනින් නැගිට බෝසතුන් දෙපාමුල පෙරළී මෙසේ ප්‍රකාශ කිරීම
  '' ප්‍රඥාවෙන් හා පිනින් උපන් බෝසත්තෙමේ කෙසේනම් දේවතාවනට නමස්කාර කරන්නේ ද?
- ශිල්පශාස්ත්‍ර ඉගෙනීම සඳහා දසදහසක් ශිෂ්‍යයන් පිරිවරා ශිල්පශාලාවට යාම
- දසදහසක් රථ සියලු ආකාරයේ ආහාර පානාදියෙන් පුරවා පාසල් දිවා ආහාරය සඳහා ගෙනයාම
- බෝසතුන්ගේ ශෝභාව හා තේජස ඉවසිය නොහැකි ව විශ්වාමිත්‍ර ආචාර්යවරයා බිම හිඳගත් විට යටිකුරුව වැටීම
- චීන, හූන ආදි භාෂාවන් ඇතුළත් හෝඩි 64ක ලැයිස්තුවක් ගුරුතුමා ඉදිරියේ ප්‍රකාශ කිරීම හා ගුරුතුමා ඇතැම් හෝඩි අසා නොතිබීම
- ගුරුතුමා උගන්වන එක් එක් අකුරකට බෝසතුන් තම අධිමානුෂික බලයෙන් ඒ අකුරින් ආරම්භ වන වාක්‍ය ඛණ්ඩයක් ද ධර්මපාඨයක් ද උච්චාරණය කිරීම
- අ - අනිත්‍යඃ සර්වසංස්කාරඃ
- ක්‍ෂ - ක්‍ෂණ පර්යන්ත අභිලාප්‍ය සර්වධර්මයාග



- දුෂ්කරක්‍රියා සමයෙහි බොසතුන් මළේ යැයි සිතා මහමායා දේවියට දන්වීම හා ඇය තුෂිත දෙව්දෙවින් පැමිණ වියළී ගිය ශරීරය දැක ඇඬීම
- ග්‍රාමදූවරු දහදෙනෙක් පැමිණ විවිධ පානවර්ගවලින් බෝසතුනට උවටැන් කිරීම
- සුජාතාවගේ කිරිපිඩු වළඳා නෙරංජා නදියේ බෝසතුන් ජලස්නානය කරන විට සහස්‍රසංඛ්‍යාත දෙවිවරු අගුරු, සඳුන් කුඩු, සුවඳ විලවුන් ජලයට දැමීම
- බෝ මැඩ කරා ගමන් ගන්නා බෝසතුන් විශේෂණ පද පනහකට අධික ප්‍රමාණයක් යොදා වර්ණනා කිරීම
- නේරංජනා නදිය හා බෝමැඩ අතර අත්‍යුත්කෘෂ්ට අවාච්‍ය සැරසිල්ලක් දෙවියන් විසින් නිර්මාණය කිරීම
- අසූදහසක් අප්සරාවෝ බෝසතුනට මල්, සඳුන්, අගුරු කුඩු ඉසිමින් ආශීර්වාද කිරීම
- පන්දහස බැගින් අප්සරාවෝ දිව්‍යමය සංගීතය සැපයීම
- බෝසතුන් තුළ සුවිශේෂී රශ්මියක් විහිදීම
- නෙරංජනා නදියේ සිට බෝමැඩ දක්වා මාර්ගය වාතවලාහක දෙවියන් විසින් ඇමදීම, වර්ෂාවලාහක දෙවියන් විසින් සුවඳදියෙන් තෙමීම
- බෝසතුන් මග වඩින විට මහාබ්‍රහ්ම පොළොව නිල් තණවලින් වසා මිණි මුතු වෛඩූර්ය ශංඛ ශිලා පබළු රන් රිදීවලින් ශෝභාමත් කිරීම
- බෝධිපරිපාලක දෙවිවරු හා බෝසත්වරු බෝමැඩ සැරසීම
- බොධිසත්ත්ව සංචෝදනී නම් රශ්මිය විහිදී සියලු බෝසත්වරුන් මෙහෙයවීම
- බෝසතුනගේ ශරීරයෙන් නික්මුණු රශ්මියෙන් සතර අපාය, නාලොව ආදියෙහි සදාකාලික අන්ධකාරය පහව යාම
- 

පාලි ත්‍රිපිටකයෙන් උපුටා ගත් කරුණු මහායානික අදහස්වලින් අලංකාර කොට බුද්ධාපදානයේ සියලු තොරතුරු තථාගතයන් වහන්සේගේ දේවාතිදේවත්ය ඔප් නැංවෙන අයුරින් දිව්‍යමය ලාලිත්‍යයක්, ලීලාවක්, ක්‍රීඩාවක් විලස සවිස්තර ව ඉදිරිපත් කෙරෙන ආකාරය ග්‍රන්ථය පුරාවට ම දක්නට ලැබේ.